## පුරාකෘත පිටස්තරයා 2



# අසුරයාගේ දුක්විඳින ගාම්භිර ආත්මය

**ආචාර්ය**
**සුනිල් විජේසිරිවර්ධන**



පුරාණ බයිබල් සම්ප්‍රදායය තුළ දෙවිලොවින් පිටුවහල් කරන ලද ලූසිෆර් නම් දේවපුත්‍රයෙක් අපට මුණගැසෙනවා. හීබෲ බයිබලයේ මෙන්ම පුරාණ ග්‍රීක භාෂාව තුළ ලූසිෆර් අර්ථ ගැන්වෙන්නේ "ආලෝකය ගෙන එන්නා" , "පහන් තරුව" යනාදී වශයෙන්. පුරාතන යුරෝපීය මාතෘමූලික ආගම් තුළ පහන් තරුව, හෙවත් පස් කොන් තාරකාව සංකේතවත් කළේ මහා දෙවගනක්. ඇගේ එක මුහුණක් - ස්වරූපයක් වෙන්න ඕන ඉපැරණි ඊජිප්තුවේ ප්‍රධාන දේවතාවියක් වූ අයිසිස් (ඉිසි) . ජේසු ක්‍රිස්තුන්ගේ ආරම්භක දහම මෙම සම්ප්‍රදායයේ දිගුවක් ලෙසයි මූල ක්‍රිස්තියානි ආගමේ "රහස දන්නා අයගේ" (Gnostic) ධාරාව විශ්වාස කරන්නේ. ඔවුන් කියන්නේ පසුකාලීන පිතෘමූලික* ඉඩම්හිමි පල්ලිය මේ කතාව යටගහල, ලූසිෆර් දේවතාවා ව බයිබලයේ එන සාතන් හෙවත් නපුරා බවට පත්කළ බවයි. දැන්, ජනප්‍රිය ක්‍රිස්තියානි අදහසට අනුව දෙවියන් වහන්සේ යහපතත්, සාතන් හෙවත් යක්ෂයා නපුරත් නියෝජනය කරනවා. එහෙත් " රහස දන්නෝ" රහස් සමාජයක් ලෙස සංවිධානගතව මධ්‍යකාලීන පල්ලියේ මර්ධනයෙන් බේරී ඉතිහාසය හරහා අර දැනීම මේ දක්වාම රැක ගෙන ආවා කියන බලගතු ප්‍රවාදයක් තියෙනවා. ඊට අනුව යුරෝපා මධ්‍යකාලීන යුගයේ, සහ ඉන්පස්සෙ පුනරුදයේ සිට අද දක්වාම , ඇතැම් කැපී පෙනෙන ප්‍රාඥ චරිත (ලියනාඩෝ ඩාවින්චි, අයිසැක් නිව්ටන් වගේ) මෙම රහස් සමාජයේ සාමාජිකයෝ. මේක දිග කතාවක්. ඔබ Dan Brown ගේ Da Vinci Code කියෙව්ව නම් ඔය පැත්තට දොරක් අරගන්න පුළුවන්.

මේ සටහනේ මගේ අරමුණ වන්නේ සම්භාව්‍ය රුසියානු සාහිත්‍යයේ සහ දෘශ්‍ය කලාවේ මතුවන පුරාකෘතික (archetypal) ආගන්තුකයෙක් හඳුන්වා දීමයි . ඒ චරිතය ඉහත කියැවෙන බයිබල් චරිතයට සම්බන්ධයි. ඒවගේම ජර්මානු සාහිත්‍යයේ Goethe ගේ Faust බේදාන්තය වගේ පූර්ව නිර්මාණ ගණනාවක් සමග කිසියම් සම්බන්ධයක් පවත්වනවා. නමුත් මම මේ කියන්න යන රුසියානු සාහිත්‍ය ධාරාව අමුතුයි , එය නිසැකින්ම කැරලිකාර අධ්‍යාත්මික මූලයකින් ප්‍රභවය ලැබූවක්.

මට මුලින්ම (මොස්කව් ශිෂ්‍ය ජීවිතය කාලේ) මේ චරිතය අමතක නොවෙන විදිහට හමුවුනේ 19 ශතවර්ෂය මුල ජීවත්වූ ((1814-1841) මිඛායිල් ලෙර්මෙන්තොව් නම් ශ්‍රේෂ්ඨ කවියාගේ The Demon නම් දීර්ඝ කාව්‍ය නිර්මාණය තුළ එන කේන්ද්‍රීය චරිතය වශයෙන්. (මේ කාව්‍යය සැලකෙන්නෙ යුරෝපා රොමැන්තික සාහිත්‍ය වංශයේ විශිෂ්ටතම නිර්මාණයක් ලෙස). දැන් ප්‍රශ්නය වෙන්නෙ කොහොමද රුසියන් භාෂාවෙන් ලියැවුනු, (Demon නමින් ඉංග්‍රීසියට පෙරළෙන) මේ වදන සිංහලෙන් කියන්නෙ කියන එකයි. සරල පිළිතුර නම් "යක්ෂයා" නමුත් සිංහල සංස්කෘතික විඥාණය තුළ "යක්ෂයා" යන වචනය අරුත් රාශියක් දරන අතර ආගමික සහ සංස්කෘතික කතිකාවන් තුළ මතුවෙන ප්‍රධාන ඇඟවුම නම් මිනිස් අධ්‍යාත්මික/ මානසික / කායික යහපැවැත්මට එරෙහි නපුරු බලවේගයක් ඉන් නියෝජනය වනවා යන්නයි. එනමුත් මෙම රුසියානු සාහිත්‍ය ධාරාව අරන් එන DEMON-වරු ජනප්‍රිය බයිබල් යක්ෂයා ට වඩා හුඟක් වෙනස් සහ සංකීර්ණ චරිත. (තව උදාහරණ ඃ විලදිමීර් අර්ලොව් ගේ "දනිලොව් නමැති අල්තෝ වාදකයා" නවකතාවේ එන දනිලොව් චරිතය, මිඛයිල් බුල්ගකොව් ගේ "මාස්ටර් සහ මාගරීටාදු නවකතාවේ එන වෝලාන්ඩ් - විදේශිකයා චරිතය).

**නමුත් ඇයට කෙමෙන් හැඟෙන්නට පටන් ගන්නවා මේ නම් නපුරු යක්ෂයෙක් නොවෙයි, දුක් විඳින ගම්භිර ආත්මයක් කියල. ඉතින් ඇයගේ හදවත හැරෙනවා ඔහු දෙසට එක් මොහොතකදී ඔහු ඇය වැළඳ ගන්නවා, ඇය ඔහුට තුරුල් වෙනවා, ඔහු ඇයව සිප ගන්නවා, එහෙත් ඒ සිපගැන්ම මාරාන්තිකයි.**

මට දැනෙන විදිහට , සිංහල පාඨකයාට මේ නමේ සැඟවුණු අරුත් මතුකරගන්න යෝජනා කළ හැකි ආසන්න පදයක් විය හැකියි "අසුර දිව්‍ය පුත්‍ර" කියන නම. මොකද මේ කතාකරන්නේ කැරලි කාර දෙවියෙක් ගැන ඃ ඔහු අමරණීයයි , අසීමිත ලෙස බලවත්. සුරයන්ගේ පර්යාලෝකයෙන් තමයි අසුරයෝ නරක කට්ටියක් වන්නෙ. හැබැයි සුරයොත් පුරාණෝ ක්ති වල හැටියට, ඊර්ෂ්‍යා බර, කාමුක, ද්වේශයෙන් ක්‍රියා කළ හැකි පිරිසක් නෙ. ඇත්තටම වෛදික පුරාණ ( සංහිතා ) කියන හැටියට සුර - අසුර දෙගොල්ලොම එකම පියාගේ (කාශ්‍යප මුනිවරයාගේ ) දරුවෝ. ලෙර්මෙන්තොව් ගේ Demon, පසු - බයිබල් සම්ප්‍රදායයේ "යක්ෂයා" ට හාත්පසින් වෙනස් අයුරින්, අපගේ සහනුකම්පනය ඇදල ගන්න බේදනීය චරිතයක්. ඉතින් මේ දීර්ඝ කාව්‍යය ආරම්භ වෙන්නේ මෙහෙම පද්‍යයකින් ඃ

පවේ ගැලූණු පොළොව මත්තෙන්
පිටුවහල් ආත්මය දරාගෙන
පියාඹනඩතර
සෝබර අසුර දෙව්පුත්
පැරණි දිවි සැරියේ
සොඳුරු මතක ගොණු
ලිහි ලිහී ලිහි ලිහී
රොක් වී ඔහු වටා.


Demon and Thamara

එල්ලයක් නැතිව මෙහෙම පොළොව උඩින් පියාඹන අනාගතය අහිමි වූ මේ අසුර දේවතාවාට තමන්ගෙ අමරණීයත්වය සහ අසීමිත බලය පෙනෙන්නෙ ජීවන අර්බුදයක් ලෙස ඃ මොකද ඔහුගෙ තනිකමත් කාංසාවත් අසීමිතයි. හදවතට සමීප කිසිදෙයක් ඔහුට හමුවන්නෙ නැහැ ඃ පොළොව මත ඔහු පූර්ණ ආගන්තුකයෙක්. කොහොම නමුත් කොකේසියානු කඳුකරය අද්දරින් පියාඹන විට තමාරා නම් මනුස්ස දෝනියක් - ජෝර්ජියානු කුමාරිකාවක් ඔහුගෙ ඇසට වැටෙනවා. ඇය සිය විවාහ මංගල්‍යයට ලක ලෑස්ති වෙමින් ඉන්න වෙලාවක් ඃ යෙහෙළියෝ පිරිවරා සුන්දර නර්තනයක් රඟන විටයි ඔහු ඇයව දකි න්නෙ.

දැන් ඔන්න, හිතාගන්න බැරි හැඟීම් මාලාවක් ඔහුගෙ හද තෙරපන්න ගන්නවා. දෙවරක් නොසිතා ඔහු තමන්ගෙ මානසික බලය නපුරු ලෙස භාවිතා කරලා කොල්ලකරුවන් පිරිසක් මෙහෙයවලා තමාරා ගෙ මංගල්‍යය බිඳිනවා . මනාලයාව විනාශ කරනවා . ඉන්පස්සෙ මේ අසුරයා තමාරා ව වසඟයට ගන්න උත්සාහ කරනවා. ඇය හොඳටම බියට පත්වෙලා ඉන්නෙ මේ "භයානක" ආගන්තුක ආත්මය ගැන. නමුත් ඇයට කෙමෙන් හැඟෙන්නට පටන් ගන්නවා මේ නම් නපුරු යක්ෂයෙක් නොවෙයි, දුක් විඳින ගම්භිර ආත්මයක් කියල. ඉතින් ඇයගේ හදවත හැරෙනවා ඔහු දෙසට ඃ එක් මොහොතකදී ඔහු ඇය වැළඳ ගන්නවා, ඇය ඔහුට තුරුල් වෙනවා, ඔහු ඇයව සිප ගන්නවා, එහෙත් ඒ සිපුම මාරාන්තිකයි. එහෙම වෙයි කියල ඔහුත් දැන සිටියෙ නැහැ. ඇය මිය යනවා. ඉතින් මිතුරු දේවදූතයෙක් ඉදිරිපත්ව ඇගේ ආත්මය දිව්‍ය ලෝකය වෙත රැගෙන යනවා. අපේ කථා නායකයා සම්පූර්ණයෙන්ම තනි වෙනවා.

"තනි ව අතරමංව
පරතෙර නොමැති විශ්වයේ
ආදරය හෝ අපේක්ෂාව
රහිතව"

ලෙර්මෙන්තොව් ගෙ The Demon ඉන්පස්සෙ ඔපෙරා හා නාට්‍ය වැනි වේදිකා නිර්මාණ, සංගීත නිර්මාණ රාශියකට මූලාශ්‍රය වුණා. ඒ අර්ථයෙන් එය සැබෑ යුගකාරක නිර්මාණයක් ඃ ඒකාකාරී , නීරස, අරුත් හීන, පිළුණු ජීවිත ගෙවන අතිබහුතරයක් මිනිසුන් ගෙ පැවැත්මට නොගැලපෙන, ඒ මැද්දෙ තනිවන ගැඹුරු ජීවිතවල බේදාන්තය මේ කාව්‍යය ඉහළට ඔසවා තියෙන බවයි පෙනුනේ. මේ නිසා උසස් කලාකරුවන් ගණනාවකගේ ජීවිතවලටත් එය බලපෑම් ඇති කළා. ඒ අතර මිඛයිල් විරූබල් (1856-1910) නමැති මහා සිත්තරාගේ කතන්දරය හද කළඹන සුළුයි . ඒ ගැන වෙනම සටහනක් ලියන්න ඕන . මේ සමග පළකරන්නේ විරූබල් ගෙ Demon and Thamara යන චිත්‍රය .

නිවැරදි කිරීමක්

**මහජන අගැයීමෙන් අපේ ඉංජිනේරුවෝ සම්මානයට**



"මහජන අගැයුමෙන් අපේ ඉංජිනේරුවෝ සම්මානයට පත් වෙති" මැයෙන් පසුලිය කළාපයේ පළ වූ වාර්තාවේ ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති ඉංජිනේරු **චින්තක ආරච්චිගේ** (Chinthaka Arachchige) මහතාගේ නම නිවැරදිව සඳහන්ව නොතිබුණ බව කරුණාවෙන් සළකන්න ඒ පිළිබඳව අපේ කණගාටුව ප්‍රකාශ කර සිටිමු

පොත පත දෙසට හෙලන විමසුම් ඇස

**"සාහිත්‍ය සම්භාෂණ"**

ඕස්ට්‍රේලියා වාසී ශ්‍රී ලාංකික ලේඛක ලේඛිකාවන්ගේ නිර්මාණ හඳුන්වා දෙන
ජගත් ජේ එදිරිසිංහ සමග දිනේෂා දිල්රුක්ෂි විජේසූරිය ඉදිරිපත් කරන
**"සාහිත්‍ය සම්භාෂණ"**
**එස්බීඑස් ගුවන් විදුලියේ සිංහල සේවයෙන්**
සෑම මසකම අවසන් අඟහරුවාදා දහවල් 11 ට FM93.1.
අන්තර්ජාලයෙන් www.sbs.com.au/yourlanguage/sinhalese/